# ප්‍රධාන කරුණු ඇතුළත් ලේඛනය - කාලීන ණය
# මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

## 1. නිෂ්පාදනය - උකස් ණය/ කාලීන ණය / ව්‍යාපෘති මූල්‍යකරණය

මෙහි අරමුණ වන්නේ, නේවාසික/වාණිජ දේපළක් උකස් කිරීම මඟින් පාරිභෝගිකයන්ගේ පුද්ගලික සහ ව්‍යාපාරික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔවුන්ගේ විවිධ මූල්‍ය අවශ්‍යතා ඉටු කරමින්, පාරිභෝගිකයන් වෙත මූල්‍ය සහාය ලබා දීමයි.

## 2. ප්‍රධාන අංග සහ ප්‍රතිලාභ

අ) ආකර්ෂණීය පොලී අනුපාත.

ආ) අවම ණය මුදල් මුදා හැරීමේ (නිකුත් කිරීමේ) කාලසීමාව.

ඇ) අරමුණ මත පදනම්ව, MBSL ආයතනයේ අභිමතය පරිදි මාස 84 ක් (වසර 07 ක්) දක්වා වූ උපරිම ආපසු ගෙවීමේ කාල සීමාවන්.

ඇ) කඩිනම් පාරිභෝගික සේවාව.

## 3. සුදුසුකම්: අයදුම්කරු,

අ) වයස අවුරුදු 18 ට වැඩි සහ අවුරුදු 65 ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ආ) පිළිගත හැකි/ඔප්පු කරන ලද ආපසු ගෙවීමේ හැකියාවක් තිබිය යුතුය.

ඇ) පැහැදිලි අතීත වාර්තාවක් තිබිය යුතුය (සෑහීමකට පත්විය හැකි ණය තොරතුරු කාර්යාංශ වාර්තා).

ඇ) අදාළ පහසුකමේ අරමුණ නීත්‍යානුකූල විය යුතුය.

## 4. පොලී අනුපාත සහ අනෙකුත් ගාස්තු

4.1 **පොලී අනුපාත**

පොලී අනුපාත පදනම් වන්නේ වත්කම්වල ගුණාත්මකභාවය, පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව වත්කම් හා වගකීම් කමිටුව විසින් ගනු ලබන තීරණය මතය. පොලී අනුපාත පරාසයේ අවමය වසරකට 18.00% කි.

**4.2අනෙකුත් ගාස්තු**

4.3 **ලේඛනගත කිරීමේ ගාස්තු**

| | |
|---|---|
| ශ්‍රී.ල.රු. මිලියන 1.0 දක්වා | ශ්‍රී.ල.රු.7,500.00 |
| > ශ්‍රී.ල.රු. මිලියන 1.0- ශ්‍රී.ල.රු. මිලියන 5.0 | ශ්‍රී.ල.රු.15,000.00 |
| > ශ්‍රී.ල.රු. මිලියන 5.0 සහ ≤ ශ්‍රී.ල.රු.මිලියන 12.5 | ශ්‍රී.ල.රු. 30,000.00 |
| **>ශ්‍රී.ල.රු. මිලියන 12.5 සහ ≤ ශ්‍රී.ල.රු. මිලියන 15** | **අවමය ශ්‍රී.ල.රු. 35,000 / උපරිමය 50,000** |

| | |
|---|---|
| >ශ්‍රී.ල.රු.මිලියන **15** | **අවමය ශ්‍රී.ල.රු. . 50,000/- / උපරිමය පහසුකමේ වටිනාකමින් 0.5%** |

**4.4 නෛතික ගාස්තු – නිශ්චල දේපළ ඇපයට තබා ලබා දෙන පහසුකම් සඳහා**

නිශ්චල දේපළ ඇපකර ලෙස ඉදිරිපත් කරන අවස්ථාවලදී, ඒවායේ හිමිකම් පරීක්ෂා කිරීම, හිමිකම් වාර්තා (Title Reports) සකස් කිරීම සඳහා මණ්ඩල නීතිඥවරුන්ට ගෙවිය යුතු ගාස්තු සහ උකස්බැඳුම්කර(Mortgage Bonds) සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් MBSL සහ මණ්ඩල නීතිඥවරුන් විසින් අය කරනු ලබන ගාස්තු පහත පරිදි වේ:

- හිමිකම් තහවුරු කිරීම සහ හිමිකම් වාර්තාව සකස් කිරීම සඳහා – රු. 7,500/-
- උකස් බැඳාපත්‍ර සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය ගාස්තු – පහසුකම් මුදලෙන් 1% කි.
- (අවමය රු. 10,000.00 සහ උපරිමය රු. 1,000,000.00)

**4.5. ගාස්තු – චල දේපළයන්ට (Movable Properties) එරෙහිව ලබාදෙන පහසුකම්**

රජයෙන් අනුමත RMV/DMT වාහන ලියාපදිංචි ගාස්තු අදාළ වේ.

**4.6. මාසික වාරික නියමිත දිනයේ නොගෙවීම / ප්‍රමාද වීම පිළිබඳ දඩ පොලිය (ඇත්නම්)**

මාසික වාරික නියමිත දිනයට ගෙවී නොමැති හෝ ප්‍රමාද වී ඇත්නම්, ප්‍රමාද වූ කාලසීමාවට මාසයකට 3%ක අතිරික්ත පොලියක් (overdue interest) අය කරනු ලැබේ.

**4.7 ඉදිරි ගෙවීම්**

ඉදිරි ගෙවීම් අවස්ථාවකදී, ඉදිරි පොලිය පිළිබඳ සහනය ලබාදීම MBSL තීරණය මත වේ.

**වත්කමක් හෝ ඉඩමක් මිලදී ගැනීම** සඳහා පහසුකම ඉල්ලා සිටින්නේ නම්**,** පහත සඳහන් ලේඛන අතිරේකව ඉදිරිපත් කළ යුතුය.

- මිලදී ගැනීමට නියමිත ඉඩමේ ඔප්පු පිටපත
- මිනින්දෝරු සැලැස්මේ පිටපත
- විකිණීමේ ගිවිසුම / විකුණුම්කරුගෙන් ලැබුණු ලිපිය
- අවශ්‍ය සෑම අවස්ථාවකදීම නිසි පරිදි සම්පූර්ණ කරන ලද බදු ඉන්වොයිසිය
- විකුණුම්කරුගේ හැඳුනුම්පත් පිටපත (ඉඩම් සහ වාහන සඳහා පමණි)

**4.8 අනෙකුත් ගාස්තු**

| **අංකය** | **ගාස්තු / අයකිරීම් පිළිබඳ විස්තරය** | **ගාස්තු / අයකිරීම් (ශ්‍රී.ල.රු.)** |
|---|---|---|
| 1 | ගිණුම් ශේෂ තහවුරු කිරීම් | 1,000.00 |
| 2 | ඔප්පුවේ සහ පිඹුරේ සහතික කළ පිටපත් | 750.00 |

| | | |
|---|---|---|
| 3 | හිඟ මුදල් නොමැති බවට වන ලිපි | 250.00 |
| 4 | පාරිභෝගික ණය පියවීමේ ඉතිහාසය | 250.00 |
| 5 | බාහිර මූල්‍ය සමාගමක් සමඟ ගිණුම් පියවීම සඳහා නිකුත් කරන ඉන්වොයිසි | 250.00 |
| 6 | සියලුම වාහන වර්ග සඳහා වන (Duplicate Deletion) ණය අවලංගු කිරීමේ ලිපි පිටපත් | 2,000.00 |
| 7 | **විරුද්ධත්වයක් නොමැති බවට වන ලිපි** | 1,000.00 |
| 8 | ණය ශේෂය තහවුරු කිරීමේ ලිපි | 1,000.00 |
| 9 | **ණය පියවීමේ ලිපි** | 750.00 |
| 10 | **ණය දෙන්නන් / මිලදී ගන්නන් වෙත නිකුත් කරන ඉන්වොයිසි** | 1,500.00 |
| 11 | වාහන ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක | 500.00 |
| 12 | අගරු වූ චෙක්පත් සඳහා වන ගාස්තු | 2,500.00 |
| 13 | **අණකරු විසින් ගෙවීම් අත්හිටුවන ලද අගරු වූ චෙක්පත්** | 5,000.00 |
| 14 | (අස්ථානගත වූ) නිදහස් කිරීමේ ඔප්පු පිළියෙල කිරීම සහ අත්සන් තැබීම (ක්‍රියාත්මක කිරීම) සඳහා වන නෛතික ගාස්තු | 7,500.00 |

## 5 ලබාගත යුතු ඇපකර සහ පිරිනැමිය යුතු නිරාවරණ

- **මුදල් සහ/හෝ ඉල්ලුම්/කාලීන තැන්පතු**

කල් පිරීමේ දී පොලී ගෙවනු ලබන තැන්පතුවක් වන විට, තැන්පතු මුදලෙන් 100% ක් දක්වා.

- **නිශ්චල දේපළ**

බැංකුවේ තක්සේරු මඬුල්ලේ තක්සේරුකරුවෙකු විසින් ලබා දෙනු ලබන, දේපළෙහි වෙන්දේසි කිරීමේදී ලැබිය හැකි විකිණුම් අගයෙන් (Forced Sale Value) 75% ක් දක්වා.

- **චංචල දේපළ**

තක්සේරු මඬුල්ලේ තක්සේරුකරුවෙකු විසින් ලබා දෙනු ලබන වෙළෙඳපොළ අගයෙන් 60% ක් දක්වා.

- **කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කොටස්**

වෙළෙඳපොළ වටිනාකමෙන් 200% ක් දක්වා.

- **නරක් නොවන ද්‍රව්‍යමය තොග**

වෙළෙඳපොළ වටිනාකමෙන් 200% ක් දක්වා.

## 6 අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

- සියලුම විභව්‍ය ගනුදෙනුකරුවන්ට ළඟම ඇති ශාඛාව වෙත පැමිණ තමන්ගේ අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කිරීමට ආරාධනා කරනු ලැබේ.
- සාකච්ඡාවෙන් අනතුරුව, ශාඛාව විසින් ගනුදෙනුකරුගේ අවශ්‍යතාවය මත පදනම්ව කරුණු ඇගයීමට ලක් කර අදාළ ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.
- අනුමත කරන ලද බලතල පැවරීමේ ලේඛනයට (DOA) අනුකූලව අනුමැතිය ලබා ගනු ලැබේ.

## 7 අවශ්‍ය ලිපි ලේඛන

### 7.1 තනි පාරිභෝගිකයන්

i. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ වත්කම් ප්‍රකාශන පත්‍රය
ii. ජාතික හැඳුනුම්පත් පිටපත
iii. වලංගු බිල්පත් සනාථ කිරීම් (මාස 06 ක කාලයක් ඇතුළත)

iv. අවසාන මාස 6 ක බැංකු ප්‍රකාශන (පුද්ගලික සහ ව්‍යාපාරික)
v. මුදල් ප්‍රවාහ ප්‍රකාශන / ආදායම් වියදම් ප්‍රකාශන
vi. ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාව (පුද්ගලික සහ ව්‍යාපාරික)
vii. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පිටපත (BR පිටපත) (තිබේ නම් පමණක්)
viii. වෙනත් ආදායම් සනාථ කරන ලියකියවිලි

**7.2 ආයතනික පාරිභෝගිකයන්**

**සීමිත වගකීම් සහිත සමාගම් / ලැයිස්තුගත සමාගම්**

i. සංස්ථාගත කිරීමේ සහතිකය
ii. සංගම් ව්‍යවස්ථාව
iii. 1 ආකෘති පත්‍රය, නවතම 13 ආකෘති පත්‍රය, 15 ආකෘති පත්‍රය, 20 ආකෘති පත්‍රය සහ බදු ගෙවීමේ රිසිට්පත් / ආදායම් බදු (නවතම) පිටපත්
iv. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයන්
v. අවසාන වසර තුනේ විගණනය කරන ලද ගිණුම්
vi. වත්මන් වර්ෂයේ කළමනාකරණ ගිණුම් / මුදල් ප්‍රවාහ ප්‍රකාශන
vii. අවසාන මාස 6 ක බැංකු ප්‍රකාශන
viii. ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාව (ව්‍යාපාරික / අධ්‍යක්ෂවරුන්ගේ)

## 8 ඇපකරයට අදාළ ලියකියවිලි -

**8.1 දේපළ උකස**

- වත්මන් අයිතිකරුගේ ඔප්පුවේ මුල් පිටපත
- වසර 10 ක් ඇතුළත අඳින ලද මුල් මිනින්දෝරු පිඹුර/සැලැස්ම (අඩි 10 කට වඩා පළල් ප්‍රවේශ මාර්ගයක් සහිත)
- පළාත් පාලන ආයතන ලියකියවිලි සහ බදු ලදුපත
- වසර 30 ක සඳහා වූ සහතික කළ පත්ඉරු (පිටපත්)
- හිමිකම් පිළිබඳ වාර්තාව
- මණ්ඩල තක්සේරුකරුවෙකුගෙන් ලබාගත් තක්සේරු වාර්තාව
- එම ඉඩමේ ගොඩනැගිල්ලක් තිබේ නම්, අනුමත කළ ගොඩනැගිලි සැලැස්ම
- අනුකූලතා සහතිකය (COC) - තිබේ නම් පමණක්
- අවශ්‍ය නම් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි (ඉඩම් සංවර්ධන ආඥාපනත / කැබලි කිරීමේ මණ්ඩලය / ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්ෂණ අධිකාරිය, ආදිය)
- අනුමත කිරීමේ අධිකාරීන් / කළමනාකාරිත්වය විසින් ඉල්ලා සිටින වෙනත් ඕනෑම ලේඛනයක්

**8.2 ඉදිකිරීම් සඳහා නම්**

- අනුමත ගොඩනැඟිලි සැලසුම
- ප්‍රමාණ විස්තර **බිල්පත** (BOQ) / පිරිවැය ඇස්තමේන්තුව (අදාළ වන්නේ නම්)

සම්පත් හෝ ඉඩමක් මිලදී ගැනීම සඳහා පහසුකම (facility) ඉල්ලා තිබේ නම්, පහත සඳහන් ලේඛන අතිරේකව ඉදිරිපත් කළ යුතුය:

- මිලදී ගැනීමට යෝජිත ඉඩමේ ඔප්පු පිටපත
- ඉඩමේ සැලැස්මේ පිටපත
- විකුණුම් ගිවිසුම / විකුණන පාර්ශවයෙන් ලැබෙන ලිපිය
- අවශ්‍ය වන විට නිසි ලෙස පුරවා ඇති බදු ඉන්වොයිසය

- විකුණුම්කරුගේ හැඳුනුම්පත් පිටපත (ඉඩම් සහ වාහන සඳහා පමණි)

## 9 9. පොදු අවශ්‍යතා

- ව්‍යාපාරික ස්ථානයේ ඡායාරූප (නාමපුවරුව සහිතව) සහ ඇපකරයේ ඡායාරූප
- පරීක්ෂණ වාර්තාව
- ණය අවශ්‍යතාවය සඳහා වන සාක්ෂි / සනාථ කරන ලේඛන
- අවශ්‍ය වෙනත් ඕනෑම ලියකියවිලි

## i. ප්‍රධාන නියම සහ කොන්දේසි

1. ණය මුදල, අයදුම්කරුවන්ට පෙර දැනුම්දීමකින් තොරව ඉල්ලා සිටින විටම හෝ Merchant Bank of Sri Lanka & Finance PLC (MBSL) විසින් අවශ්‍ය යැයි සලකා බලන ඕනෑම වේලාවක ආපසු ගෙවිය යුතුය.
2. MBSL වෙතින් පෙර ලිඛිත අනුමැතිය ලබා නොගෙන, 2.1 හි සහ ඉහත සඳහන් දේපළ පිළිබඳ අයදුම්කරුවන්ට එවකට හිමි වන කිසිදු අයිතියක් කුලියට දීම, බදු දීම හෝ වෙනත් ආකාරයකින් පවරා දීම අයදුම්කරුවන්ට අවසර නොලැබේ.
3. අයදුම්කරුවන් විසින් එම දේපළ මත කිසිදු උකස්කරයක් (mortgage), හිලව් කිරීමේ අයිතියක(lien) හෝ වෙනත් බැඳීමක් (encumbrances) නිර්මාණය නොකරන බවටත්, එවැනි දෙයක් නිර්මාණය කිරීමට ඉඩ නොදෙන බවටත් භාරයක් ගත යුතුය.
4. MBSL වෙත අයදුම්කරුවන්ගේ ව්‍යාපාරයේ ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ අයිතිය ඇත.
5. MBSL වෙතින් පෙර අනුමැතිය ලබා නොගෙන, අයදුම්කරුවන් වෙනත් ආයතනවලින් කිසිදු ණය පහසුකමක් ලබා නොගත යුතුය.
6. හිඟ මුදල් අයකර ගැනීමේ අරමුණින්, MBSL නිලධාරීන්ට අයදුම්කරුවන්ගේ ව්‍යාපාර ස්ථානයට හෝ වාසස්ථානයට පැමිණීමට බලය ඇත, එවැනි පැමිණීම් සම්බන්ධ වියදම් අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.
7. ව්‍යාපාර පරීක්ෂණ අරමුණින්, MBSL විසින් අවශ්‍ය යැයි සලකා බැලූ අවස්ථාවන්හි අයදුම්කරුවන්ගේ සහ/හෝ ඇපකරුවන්ගේ ව්‍යාපාර ස්ථාන හෝ වාසස්ථාන වෙත ප්‍රවේශ වීමට අයිතිය ඇත. එවැනි පරීක්ෂණ, අදාල අයදුම්කරුවන්ට සහ/හෝ ඇපකරුවනට පෙර දැනුම්දීමක් ලබා දී හෝ ලබා නොදී සිදු කළ හැක.
8. මෙම පහසුකමට අදාල අනෙකුත් සියලුම නියම සහ කොන්දේසි ඇතුළත්වන කාලීන ණය ගිවිසුමක් (Term Loan Agreement) පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, එම ගිවිසුම පිරිනැමීමේ ලිපියේ අංගයක් ලෙස සැලකේ.
9. මෙහි ඉහත සඳහන් නියමයන් අනුව, MBSL විසින් පහසුකම අවසන් කරන අවස්ථාවක, අයදුම්කරුවන්ට සහ/හෝ ඇපකරුවනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමටත්, ලබා දී ඇති භද්‍රතා අවසන් කරමින් (foreclose) MBSL වෙත හිමිවිය යුතු මුදල් සහ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධ සියලුම වියදම් (මුද්දර ගාස්තු, නීතිඥ ගාස්තු ආදිය ඇතුළුව) අයකර ගැනීමටත් MBSL වෙත අයිතිය ඇත.
10. පහසුකමේ වටිනාකමට සමාන වන පරිදි "උකස අඩු වන ආකාරයේ රක්ෂණ ඔප්පුවක්" (Mortgage Reducing Policy) ණය ගැතියා විසින් ලබාගත යුතු අතර, එය MBSL ආයතනය වෙත පැවරිය යුතුය.
11. මෙම (ණය) පහසුකම යටතේ ඔබ විසින් MBSL වෙත එදිනට ගෙවීමට ඇති සහ ගෙවිය යුතු මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් පියවීම සඳහා, MBSL හි ගිණුම් පොත්වල ඇති ඕනෑම තැන්පතු හෝ ආයෝජන ගිණුමක හෝ වෙනත් ඕනෑම ගිණුමක හෝ ගිණුම්වල බැර වී ඇති ඕනෑම මුදලක් හිලව් කිරීමට, ප්‍රයෝජනයට ගැනීමට, යෙදවීමට සහ/හෝ වෙන්කරවා ගැනීමට MBSL වෙත අයිතිය ඇත; සහ/හෝ ස්ථිර හෝ අහඹු (සිදුවිය හැකි) වූද ඔබගේ ඕනෑම වගකීමක් MBSL වෙත ගෙවීම හෝ පියවීම සඳහා එම මුදල් යෙදවීමට හෝ රඳවා තබා ගැනීමට MBSL වෙත අයිතිය ඇත. එවැනි හිලව් කිරීමේ අයිතිවාසිකමක් ක්‍රියාත්මක කළ වහාම හෝ ක්‍රියාත්මක කිරීමට අදහස් කල වහාම, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර ලබා දෙමින් MBSL විසින් ඔබව ඒ පිළිබඳව දැනුම්වත් කළ යුතුය.
12. මෙයට අනුකූලව ලබා දී ඇති ස්ථාවර කාලීන ණය පහසුකමේ (Term Loan Facility) කොන්දේසි යටතේ ගෙවිය යුතු සියලුම මුදල්, ලංකා බැංකු මර්චන්ට් ටවර්, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයේ පිහිටි මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (MBSL) හි ලියාපදිංචි ලිපිනය වෙත ගෙවිය යුතුය;

කෙසේ වෙතත්, ණය ගැතියා විසින් MBSL හි ඕනෑම ශාඛා කාර්යාලයකට කරනු ලබන ගෙවීම් හෝ වෙනත් ඕනෑම ක්‍රමයකින් කරනු ලබන ගෙවීම් භාර ගැනීමට සහ ඒවා නිසි පරිදි (ණය ගිණුමට) බැර කිරීමට තමන්ගේ අභිමතය පරිදි කටයුතු කිරීමට MBSL ආයතනයට හැකියාව ඇත.

13. MBSL ආයතනය වෙත ඇපකරයක් ලෙස ලබා දී ඇති දේපළෙහි ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, MBSL විසින් පිළිගත හැකි රක්ෂණකරුවෙකුගෙන් (රක්ෂණ සමාගමකින්) වටිනාකමකට ගිනි රක්ෂණ ඔප්පුවක් (ණය ගැතියා විසින් ලබාගත යුතු අතර, එම රක්ෂණ ඔප්පුව MBSL ආයතනය වෙත පැවරිය යුතුය. එම රක්ෂණ ඔප්පුව වාර්ෂිකව අලුත් කළ යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වුවහොත්, එය අලුත් කිරීමේ අයිතිය MBSL සතු වන අතර ඒ සඳහා වන ගාස්තු ඔබගේ ණය ගිණුමට හර කරනු ලැබේ.

## 10 අවසන් කිරීම සහ අයකර ගැනීම - නෛතික ක්‍රියාපටිපාටිය

මෙහි ඇතුළත් පූර්ව කොන්දේසි ප්‍රකාරව MBSL ආයතනය විසින් මෙම පහසුකම අවසන් කරනු ලබන අවස්ථාවක දී, අයදුම්කරු/ අයදුම්කරුවන් සහ/හ ඇපකරු/ ඇපකරුවන් වෙත එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමටත්, MBSL ආයතනය වෙත ගෙවිය යුතු හිඟ මුදල් සමඟ මුද්දර ගාස්තු, නීති ගාස්තු ඇතුළු නීතිමය කටයුතුවලදී දරන්නට වූ සියලුම පිරිවැය අයකර ගැනීම සඳහා ලබා දී ඇති ඇපකර අත්පත් කර ගැනීමට/විකිණීමට MBSL ආයතනයට හිමිකම ඇත.

## 11 අදාළ වන නෛතික විධිවිධාන

අ) 1946 අංක 06 දරන සංශ ධිත උකස් පනත
ආ) 1982 අංක 29 දරන පාරිභ ගික ණය පනත
ඇ) ගිවිසුම් නීතිය
ඈ) ශ්‍රී ලංකාවේ සිවිල් සහ අපරාධ නීතිය
ඉ) 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත
ඊ) 1998 අංක 21 දරන හිමිකම ලියාපදිංචි කිරීමේ පනත
උ) 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත
ඌ) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත
එ) 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත
ඒ) 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත
ඔ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත
ඕ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

## 12 පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

පාරිභ ගිකයන් හට අපගේ ණය පහසුකම හ සේවාවන් සම්බන්ධයෙන් වන පැමිණිලි පහත සඳහන් ඕනෑම ක්‍රමයක් මඟින් ඉදිරිපත් කළ හැකිය;

**අ)** ළඟම පිහිටි ශාඛාව වෙත පැමිණ ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීම.

**ආ)** අපගේ පාරිභ ගික සේවා ක්ෂණික ඇමතුම් අංක 011 - 4 711 711 ඇමතීම මඟින් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හ info@mbslbank.com / customercare@mbslbank.com යන විද්‍යුත් තැපැල් ලිපින හරහා දැනුම් දීම.

**ඇ)** තැපැල් මඟින් - පහත ලිපිනය වෙත ලිඛිතව පැමිණිල්ල යොමු කිරීම;

**පැමිණිලි හැසිරවීමේ නිලධාරී (වැඩබලන),**
**මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,**
**අංක 28, ලංකා බැංකු මර්චන්ට් කුළුණ,**
**ශාන්ත මයිකල් පාර,**
**කොළඹ 03.**